නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා වෙත පානයක් ගෙන එන ලදී. එවිට එතුමා එයින් පානය කළහ. එතුමාගේ දකුණතින් දරුවකු විය.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- පැවසූ බව සහ්ල් ඉබ්නු සඃද් රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්තා කරන ලදී. නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන්- සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-තුමා වෙත පානයක් ගෙන එන ලදී. එවිට එතුමා එයින් පානය කළහ. එතුමාගේ දකුණතින් දරුවකු විය. වමතින් වැඩිහිටියන් විය. එවිට එතුමා එම දරුවා අමතා
“මා මෙය මොවුනට පිරිනැමීමට ඔබ මට අවසර දෙන්නෙහිද?“ යැයි විමසා සිටියහ. එවිට එම
දරුවා “නැත, අල්ලාහ් මත දිවුරා පවසමි අල්ලාහ්ගේ දූතයාණනි! මාගේ කොටසෙහි භාග්යය මගෙන් වෙනත් කිසිවකුට මා පිරි නොනමමි.“ එවිට අල්ලාහ්ගේ දූතයාණන්-සල්ලල්ලාහු
අලය්හි වසල්ලම්-තුමා එය ඔහුගේ අතෙහි තැබූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

මෙම හදීසයේ නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-තුමා, එම දරුවාගෙන් ඔහුට පෙර වැඩිහිටියන්ට පානය පිරිනැමීමට අවසර පැතූහ. එසේ එතුමා කළේ වැඩිහිටියන්ගේ හදවත් ඒත්තු ගැන්වීමටත් ඔවුන් වෙත වූ සෙනෙහස දන්වා සිටීමටත් ඔවුනට වැඩියෙන් ගෞරවය කිරීමටත්ය. වයස එය නොවැළැක් වූයේ මෙම සුන්නාවෙහි අන්තර්ගතය වනුයේ දකුණු පැත්ත වඩාත් සුදුසු බවය. ඔහුගේ අවසරයෙන් තොරව වෙනත් කෙනෙකුට පැවරිය නොහැක. ඔහුගේ අවසරය පැතීමෙන් එසේ සිදු කිරීම වරදක් නැත. අවසර පැතිය යුතු යැයි අනිවාර්යය බවක් නොමැත. එහිදී මතුලොව මහිමය හා මෙලොවෙහි යහපත අහිමි නොවන තත්ත්වයක් වී නම් අවසර පැතීමක් අවශ්ය නොවේ. මෙම දරුවා ඉබ්නු අබ්බාස් - රළියල්ලාහු අන්හුමා- තුමාය.

https://sunnah.global/hadeeth/si/show/5651